<u>පාර්ලිමේන්තු ප්‍රශ්න 2319/12</u>

(අ) (I) බුද්ධ ධර්මය
හින්දු ධර්මය
කතෝලික ධර්මය
ඉස්ලාම් ධර්මය

(II)

| ආගම | සිද්ධස්ථානයේ නම |
|---|---|
| බුද්ධ ධර්මය | 1. තිරියායේ ගිරිහඬු සෑ රජමහා විහාරය |
| | 2. මහියංගන රජමහා විහාරය |
| | 3. නාගදීප රජමහා විහාරය |
| | |
| හින්දු ධර්මය | 1. තිරුකෝනේශ්වරම් |
| | 2. තිරුකේතීශ්වරම් |
| | 3. නගුලේශ්වරම් |
| | |
| කතෝලික ධර්මය | 1. මරුදමඩු (මඩු) සිද්ධස්ථානය |
| | 2. තලවිල ශාන්ත ආනා මුන්ශ්වරිගේ සිද්ධස්ථානය |
| | 3. වහකෝට්ටේ ශාන්ති අන්තෝනි මුනිඳුන්ගේ සිද්ධස්ථානය |
| | |
| ඉස්ලාම් ධර්මය | 1. මස්ජිදුල් අබ්‍රාර් පල්ලිය |
| | 2. මුහියිදීන් කොතුබා පල්ලිය |
| | 3. මීරා මක්කම් පල්ලිය |

(III) ඔව

| ආගම | සිද්ධස්ථානයේ නම | පිහිටි ස්ථානය | කාල වකවානුව |
|---|---|---|---|
| බුද්ධ ධර්මය | 1. තිරියායේ ගිරිහඬු සෑ රජමහා විහාරය | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය, කුච්චවේලි ප්‍රා.ලේ.කො. | ක්‍රි.පූ. 3 වන සියවස |
| | 2. මහියංගන රජමහා විහාරය | බදුල්ල දිස්ත්‍රික්කය මහියංගණය ප්‍රා.ලේ.කො. | ක්‍රි.පූ. 3 වන සියවස |
| | 3. නාගදීප රජමහා විහාරය | යාපනය දිස්ත්‍රික්කය වේලනෙයි ප්‍රා.ලේ.කො. | ක්‍රි.පූ. 3 වන සියවස |
| හින්දු ධර්මය | 1. තිරුකෝනේශ්වරම් | ත්‍රිකුණාමලය | 7 වන ශතවර්ෂයට පෙර ඉදිකරන ලදැයි සැලකේ. |
| | 2. තිරුකේතීශ්වරම් | මන්නාරම "මාන්තෙයි" | 7 වන ශතවර්ෂයට පෙර ඉදිකරන ලදැයි සැලකේ. |
| | 3. නගුලේශ්වරම් | යාපනයේ "කීරිමැලෙ" | 16 වන ශතවර්ෂයට පෙර ඉදිකරන ලදැයි සැලකේ. |
| කතෝලික ධර්මය | 1. මරුදමඩු (මඩු) සිද්ධස්ථානය | මන්නාරම | 17 වන සියවස |
| | 2. තලවිල ශාන්ත ආනා මුන්ශ්වරිගේ සිද්ධස්ථානය | තලවිල | වර්ෂ 1713 |
| | 3. වහකෝට්ටේ ශාන්ත අන්තෝනි මුනිඳුන්ගේ සිද්ධස්ථානය | වහ කෝට්ටේ | 17 වන සියවස |
| ඉස්ලාම් ධර්මය | 1. මස්ජිදුල් අබ්‍රාර් පල්ලිය | මරදාන , බේරුවල | නිශ්චිතව කිව නොහැක |
| | 2. මුහියිදීන් කොතුබා පල්ලිය | පුත්තලම නගරය | නිශ්චිතව කිව නොහැක |
| | 3. මීරා මක්කම් පල්ලිය | මහනුවර | නිශ්චිතව කිව නොහැක |

(ආ) (I)

➢ බුද්ධ ධර්මය

| විහාරස්ථානය | වෙන් කළ මුදල |
|---|---|
| 1. තිරියායේ ගිරිහඩු සෑ රජමහා විහාරය | - |
| 2. මහියංගණ රජමහා විහාරය | - |
| 3. නාගදීප රජමහා විහාරය | - |

➢ හින්දු ධර්මය

ප්‍රතිපාදන පිළිබඳ විස්තර

| කෝවිලේ නම | වර්ෂය | ලබාදුන් මුදල් ප්‍රමාණය |
|---|---|---|
| තිරුකෝනේශ්වරම් | 2004 | 1,500,000.00 |
| | 2008 | 500,000.00 |
| | 2011 | 100,000.00 |
| **එකතුව** | | **2,100,00000** |
| තිරුක්කේදීශ්වරම් | 2005 | 400,000.00 |
| | 2006 | 200,000.00 |
| | 2012 | 100,000.00 |
| | 2011 – 2012 "උතුරු වසන්තය" | 74,650,000 |
| **එකතුව** | | **75,350.000** |
| කීරිමලෙල නගුලේශ්වරම් | 2004 | 200,000.00 |
| | 2005 | 500,000.00 |
| | 2006 | 4,000,000.00 |
| | 2010 | 1,000,000.00 |
| **එකතුව** | | **5,700,000.00** |

(ආ) (I)

➢ කතෝලික ධර්මය

| | 2008 | | 2009 | | 2010 | | 2011 | | 2012 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| සිද්ධස්ථානය | සංවර්ධන | මංගල්‍යය | සංවර්ධන | මංගල්‍යය | සංවර්ධන | මංගල්‍යය | සංවර්ධන | මංගල්‍යය | සංවර්ධන | මංගල්‍යය |
| 01මඩු | | | | 1,000,000.00 | | 250,000.00 | | 400,000.00 | 2,093,000.00 | 1,129,881.00 |
| | | | | | | | | 1,365,095.72 | | |
| | | | | | | | | | | |
| 02.තලවිල | 3,255,000.00 | 198,540.00 | | 250,000.00 | | 300,000.00 | 2,250,000.00 | 350,000.00 | 855,400.00 | 392,000.00 |
| | | 200,000.00 | | 250,000.00 | | 300,000.00 | | 450,000.00 | 4,377,100.00 | 580,000.00 |
| | | 15,000.00 | | 15,000.00 | | | | | | |
| | | | | | | | | | | |
| *03.වහකෝට්ටේ | | 200,000.00 | | 250,000.00 | 1,625,000.00 | 300,000.00 | 1,000,000.00 | 533,133.43 | 1,183,000 | 525,954.00 |
| | | | | | | | | | | |

* මෙම සිද්ධස්ථාන භූමියේ 18 වන සියවසේ සිට සිද්ධස්ථාන 03 ක් පැවති අතර වර්තමාන සිද්ධස්ථානය ගොඩනඟා දැනට වසර 125 කි.

- **<u>ඉස්ලාම් ආගම:-</u>**

  මහනුවර මීරා මක්කම් පල්ලිය ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් 100,000/= ක් 2012 වර්ෂයේදී ලබා දී ඇත.

(ආ) (II)

- **<u>බුද්ධ ධර්මය</u>**

  මෙම පූජනීය ස්ථාන අතරින් මහියංගණය රජමහා විහාරය පූජා භූමියක් වශයෙන් ගැසට් මඟින් ප්‍රකාශයට පත්කර ඇති අතර එම විහාරස්ථාන තුනම එක් එක් ස්ථානයේ පවත්නා ඓතිහාසික හා පූජනීය වැදගත්කම සැලකිල්ලට ගෙන සංවර්ධනය කිරීම සඳහා පියවර ගනිමින් තිබේ.

  **මහියංගණ රජමහා විහාරය**

  පූජා භූමියක් ලෙස ගැසට් කොට ඇත. මේ වන විට අමාත්‍ය මණ්ඩලයේ තීරණය පරිදි සංවර්ධන කටයුතු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනෙමින් පවතී.

  **ගිරිහඬු සෑ රජමහා විහාරය**

  පූජා භූමියක් ලෙස ගැසට් කිරීමට අවශ්‍ය මිනුම් වාර්තා ලබා ගැනීමට කටයුතු කර ඇත. සංවර්ධන කටයුතු කිරීම හා අධීක්ෂණය සඳහා කමිටුවක්ද පත් කොට ඇත.

  **නාගදීප රජමහා විහාරය**

  මේ වන තෙක් පූජා භූමියක් බවට පත් කොට නැත. එහෙත් සංරක්ෂණ කටයුතු හා සංවර්ධන කටයුතු ඉටු කෙරෙමින් පවතී.

  ( පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත ස්ථාන සංරක්ෂණය කිරීමේදී පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ පූර්ණ මඟ පෙන්වීම යටතේ එම කටයුතු සිදුවිය යුතු අතර අතීත උරුමයන් අනාගත පරපුරට ආරක්ෂා සහිතව නැරඹිය හැකි වන පරිදි සංරක්ෂණය කිරීම කළ යුතු වේ).

- **<u>හින්දු ධර්මය</u>**

  යුද්ධය නිසා විනාශ වී ඇති මෙම කෝවිල් සංවර්ධනය කිරීම සඳහා රජය මඟින් වරින්වර ප්‍රතිපාදන ලබා දෙන ලදී.

- **<u>කතෝලික ධර්මය</u>**

  අදාළ සිද්ධස්ථානයන්හි පියතුමන්ලාගේ ඉල්ලීම් පරිදි හා පදවි බාර රදගුරුතුමන්ලාගේ නිර්දේශයන් ලබා ගනිමින් එම සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම හා ආගමික උත්සව සංවිධානය කිරීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබාදීම. (මඩුමඩු මංගල්‍ය සඳහා පැමිණෙන බැතිමතුන්ගේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙහිලා වර්ෂයකට දෙවතාවක් (ජූලි හා අගෝස්තු මංගල්‍යයන්)

- **<u>ඉස්ලාම් ධර්මය</u>**

  එම සිද්ධස්ථානද ඇතුලුව ඉස්ලාම් ආගමික පූජනීය සිද්ධස්ථානවල පාලනය, නඩත්තුව, ප්‍රතිසංස්කරණය, සංරක්ෂණය, සංවර්ධනය සහ ආගමික කටයුතු එම පල්ලි භාරකාර මණ්ඩල විසින් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ නියාමනය යටතේ සිදුකරයි. ඒ සඳහා,

  1. ලැබෙන ඉල්ලීම් පරිදි වාර්ෂිකව තෝරාගත් පල්ලිවල සංවර්ධන වැඩ සඳහා ප්‍රතිපාදන ලබාදීම,
  2. වකුෆ් පනතේ විධිවිධාන මඟින් ස්ථාපිත වකුෆ් සභාව සහ වකුෆ් විනිශ්චය සභාව පවත්වාගෙන යාම,
  3. පල්ලි භාරකාර මණ්ඩල තෝරාපත් කරගැනීමට අදාළ කටයුතු සිදුකිරීම,

  දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබයි.

(ඇ) අදාළ නොවේ.